## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

BOI SRI LANKA

# කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ ආයෝජන අවස්ථා

### *නව යුගයක උදාව අභියස*

ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින්, ගොවිපළක ගවයන් 1,000 - 1,500කින් සමන්විත, නවීන තාක්ෂණයෙන් යුත් මහා පරිමාණ කිරි ගොවිපළ 10-15 පමණ සංඛ්‍යාවක් සුදුසු ස්ථානවල පිහිටුවීමට අනුමත කර ඇත. මෙම ව්‍යාපෘතියට සමගාමීව, වියළි කලාපයේ මහා පරිමාණ බඩ ඉරිඟු/ගව ආහාර ගොවිපළ ස්ථාපිත කිරීම මඟින් ගව ආහාර අවශ්‍යතාවය ප්‍රමාණවත් ලෙස නිෂ්පාදනය කිරීම හා සැපයීම සහතික කිරීමට රජය අදහස් කරයි.

**මෙම ව්‍යාපෘතිය සඳහා පහසුකම් සැලසීම සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය ආයෝජන මණ්ඩලය වෙත පැවරී ඇත.**

### ව්‍යාපෘති යෝජනා සඳහා ආරාධනා කරනුයේ;

**ඉඩම් හිමියන්**
- බදු හිමියකු ලෙස/හවුල්කාර පාර්ශ්වයක් ලෙස
- මහා පරිමාණ කිරි ගොවිපළක් සඳහා ආයෝජනය කිරීම

**උනන්දුවක් දක්වන ආයෝජකයින්**
- මහා පරිමාණ කිරි ගොවිපළක් සඳහා ආයෝජනය කිරීම
- වියළි කලාපයේ හඳුනාගත් රජයේ ඉඩම්වල බඩ ඉරිඟු /ගව ආහාර වගා කිරීම

**මහා පරිමාණ කිරි ගොවිපළ හිමියන්**
- අතිරේක මහා පරිමාණ කිරි ගොවිපළවල් සඳහා ආයෝජනය කිරීම
- වියළි කලාපයේ හඳුනාගත් රජයේ ඉඩම්වල බඩ ඉරිඟු /ගව ආහාර වගා කිරීම

### සම්පත් දායකත්වය;

**ශ්‍රී ලංකා රජය**
- බඩ ඉරිඟු/ගව ආහාර වගා කිරීම සඳහා වියළි කලාපයේ ඉඩම් ලබා දීම
- පශු වෛද්‍ය සේවා පහසුකම් ලබාදීම

**මධ්‍යම පරිසර අධිකාරිය**
- ඇවැසි පාරිසරික අනුමැතීන් කඩිනමින් ලබාදීම

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**
- ඉඩම් හිමියන් සහ ආයෝජකයින් අතර හවුල් ව්‍යාපාර ඇරඹුම සඳහා අතරමැදියෙකු ලෙස ක්‍රියාකිරීම
- වේගවත් ආයෝජන අනුමැතිය සහ ආශ්‍රිත දිරි දීමනා ලබා දීම
- වියළි කලාපයේ රජයේ ඉඩම් සඳහා බදු හිමිකරු ලෙස කටයුතු කිරීම

ආයෝජන මණ්ඩල වෙබ් අඩවියෙන් (www.investsrilanka.com) හෝ ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුවෙන් ආකෘති පත්‍රය ලබා ගත හැකි අතර, එය නිසි පරිදි සම්පූර්ණ කර ව්‍යාපෘති යෝජනා සමඟ 2020 නොවැම්බර් 15 වන දින හෝ ඊට පෙර, ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා තමරි බටුවන්තුඩාව මහත්මිය වෙත ඉදිරිපත් කළ යුතුය.

පූර්ව යෝජනා සම්මන්ත්‍රණයක් **2020 ඔක්තෝබර් 29** වන දින **පැය 10:00ට කොළඹ 01, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, 8 වන මහලේ පිහිටි ආයෝජන මණ්ඩල ප්‍රධාන කාර්යාලයේදී** පැවැත්වේ. මෙම සම්මන්ත්‍රණය සඳහා thamarib@boi.lk යන විද්‍යුත් තැපෑල ඔස්සේ පූර්ව ලියාපදිංචි වන ලෙස යෝජනා ඉදිරිපත් කරන්නන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටින අතර අවශ්‍යතාවය පරිදි ආදර්ශ ගොවිපළක් නැරඹීමට කටයුතු සලසනු ලැබේ.






වැඩිදුර තොරතුරු සඳහා
ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා තමරි බටුවන්තුඩාව මහත්මිය,
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය,
24 වන මහල - බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 1,
දු.ක. අංක: 0094 11 2386 953, ෆැක්ස් අංකය: 0094 11 2422 407, විද්‍යුත් තැපෑල: thamarib@boi.lk